# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | 5 ඒකකය |
|---|---|---|

### ආදර්ශ ප්‍රශ්න පත්‍ර

01. අපරදිග සංගීතයට අනුව මූලික කොඩ් (chord) එකක් ලෙස සුසංගත වීමට සුදුසු ස්වර තුනක් වන්නේ,
    (i). ස රි ග (ii). ප ධ නි (iii). ස ම ප (iv). ස ග ප

02. හාර්මනි (Harmony) නොහොත් ස්වර සංවාද සිද්ධාන්තය මත පදනම් වූ සංගීත පද්ධතිය වනුයේ,
    (i). උත්තර භාරතීය සංගීතය (iii). අපරදිග සංගීත පද්ධතිය
    (ii). දක්ෂිණ භාරතීය සංගීතය (iv). දේශීය ජන සංගීතය

03. අපරදිග සංගීතයේ ප්‍රධාන කෝඩ්ස් වර්ග,
    (i). එකකි (ii). දෙකකි (iii). තුනකි (iv). හතරකි

04. කෝඩ්ස් නිර්මාණයේදී C, F, G යන කෝඩ්ස් 3 ප්‍රධාන වේ. මින් (G Major) (Chord) නිර්මාණයේදී යොදා ගන්නා ස්වර 3 වනුයේ,
    (i). ස ග ප (C E G) (ii). රි ම́ ධ (D F A) (iii). ප නි රි (G B D) (iv). ම ධ ස̇ (F A C)

05. C Minor (සී මයිනර්) කෝඩ්ස් සඳහා යොදා ගන්නා ස්වර වනුයේ,
    (i). C E$^b$ G (ii). D F A (iii). E G B (iv). F A$^b$ C

06. බටහිර සංගීතයේ ස්වර භාවිතා කරමින් Major හා Minor Chords 12 සැදෙන ආකාරය පෙන්නුම් කරන්න. (ස්වර 12 න්ම සැදෙන ආකාරය පෙන්නුම් කරන්න.)

07. පහත සඳහන් ස්වර ප්‍රස්ථාරය (පෙරදිග) බටහිර රේඛා මණ්ඩලයක ප්‍රස්ථාරගත කරන්න.

| | | | |
|---|---|---|---|
| ස - ග ග | ස - ග ග | ප - ම ග | රි - - - |
| ධ - ප - | ම - ග - | රි - ග රි | රි - - - |

    (i). ප්‍රස්ථාරයට අදාළ (ටයිම් සිග්නේචර්) තාල සංකේත බටහිර ප්‍රස්ථාරයේ යොදන්න.
    (ii). පළමු පේළියට අදාළ (Chords) 4 යොදන්න.
    (iii). මෙම ස්වර ප්‍රස්ථාරය අයත් ස්කේලය නම් කර එම ස්කේලයට අයත් ස්වර සප්තකය ලියන්න.

08. බටහිර සංගීත ක්‍රමයේ හා පෙරදිග සංගීත ක්‍රමයේ ඇති සම විෂමතා පෙන්නුම් කරන්න.

09. බටහිර සංගීතයේ ස්වරවල වටිනාකම දැක්වීමට භාවිතා කරන Crochet (ක්‍රොචට්), Minim (මිනිම්), (Semibreve) සෙමිබ්‍රිව් සංකේත හා ඒවායේ වටිනාකම් ඉදිරිපත් කරන්න.

10. ඔබ කැමති ඕනෑම ස්වර ප්‍රස්ථාරයක් මධ්‍යම පංචම භාවයෙන් ප්‍රස්ථාර කරන්න.